00034

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

අධ්‍යාපනයේ පදනම - ESU3226

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.01.30 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. "තමා ගැන අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය දැනුම් දීමේ ක්‍රියාවලිය අධ්‍යාපනයයි". මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? හේතු තුනක් (03) දක්වන්න.

02. දර්ශනය මඟින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යය තුනක් (03) නම් කරන්න.

03. විධිමත් අධ්‍යාපනයේ විශේෂ ලක්ෂණ තුනක් (03) සඳහන් කරන්න.

04. මහත්මා ගාන්ධිතුමා ඉදිරිපත් කළ නයිතාලිම් අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන සිද්ධාන්ත නම් කරන්න.

05. පන්තිකාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සුදුසු අරමුණක් දක්වා එහි සුවිශේෂී ලක්ෂණ සඳහන් කරන්න.

06. සමාජානුයෝගී නොවූ ළමුන් තුළ දැකිය හැකි චර්යා ලක්ෂණ දෙකක් (02) නම් කරන්න.

07. විවෘත අධ්‍යාපනය යන සංකල්පය සැකෙවින් විස්තර කරන්න.

08. සංවර්ධනය සඳහා අධ්‍යාපනයට දායක විය හැකි ආකාර දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. i. ජෝන්ඩූවීගේ අධ්‍යාපන දර්ශනයේ දී ඔහු පදනම් කරගත් ප්‍රධාන කරුණු දෙක (02) නම් කරන්න. (ලකුණු 04)

ii. ජෝන්ඩූවී ඉදිරිපත් කළ විෂයමාලාව සකස් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් (02) නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ජෝන්ඩූවී යෝජනා කළ ඉගැන්වීම් ක්‍රම තුනක් (03) නම් කර, ඉන් එකක් නාට්‍ය හා රංගකලා විෂයය තුළ භාවිත කළ හැකි ආකාරය නිදසුන් තුනක් (03) මඟින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

10. i. 'ආකල්ප' සහ 'සාරධර්ම' සංකල්ප නිර්වචනය කරන්න. (ලකුණු 04)

ii. ආකල්ප ඇසුරින් සාරධර්ම සංවර්ධනය සිදුකළ හැකි ආකාර දෙකක් (02) සුදුසු නිදසුන් මඟින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

iii. ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා සාරධර්ම යොදා ගැනීමේ දී ගුරුවරයෙක් ලෙස ඔබට මතුවිය හැකි ගැටලු දෙකක් (02) සඳහන් කර එම ගැටලු මඟහරවා ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

11. i. සමාජානුයෝජනය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii දරුවන් සමාජානුයෝගී කිරීමේ දී සමවයස් කණ්ඩායම්වල භූමිකාව කෙසේ විය යුතුදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 08)

iii. පාසලේ දී සමවයස් කණ්ඩායම් සිදුකරන සෘණාත්මක බලපෑම අවම කිරීම සඳහා නාට්‍ය හා රංගකලා ගුරුවරයෙක් ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

12. i. සමාජ සචලනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. පුද්ගලයින්ගේ සමාජ සචලතාව ප්‍රවර්ධනය සඳහා අධ්‍යාපනයට සහාය විය හැකි ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. ළමුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි සමාජ පන්තිය බලපෑම් ඇති කරනු ලබයි. ඉහත ප්‍රකාශය ශ්‍රී ලාංකීය සමාජය ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13. i. අධ්‍යාපනය සහ ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. සමාජයේ පූර්ණ සංවර්ධනය සඳහා අධ්‍යාපනයට පැවරෙන වගකීම් තුනක් **(03)** විශ්ලේෂණය කරන්න. (ලකුණු 08)

iii. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ විද්‍යාමාන වන ගැටලු තුනක් **(03)** සඳහන් කර එම ගැටලු මඟහරවා ගැනීමට සිදුකළ හැකි වෙනස්කම් යෝජනා කරන්න. (ලකුණු 08)

14. i. නාට්‍ය හා රංගකලා ගුරුවරයාට අධ්‍යාපන දර්ශනය වැදගත්වන ආකාරය හේතු තුනක් **(03)** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. මාරියා මොන්ටිසෝරිගේ අධ්‍යාපන දර්ශනයේ මූලික ප්‍රතිපත්ති හතරක් **(04)** නම් කර, ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 08)

iii. නාට්‍ය හා රංගකලාව විෂය ඉගැන්වීමේ දී ශිෂ්‍යයා අවබෝධ කර ගැනීමේ වැදගත්කම සුදුසු නිදසුන් ඇසුරින් ඇගයීමට ලක් කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.